**ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)**

# පුරප්පාඩු

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) පහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. අධ්‍යක්ෂ (ව්‍යාප්ති) තනතුර - HM - 1-1 - 2025
## 02. අධ්‍යක්ෂ (වෙරළබඩ) තනතුර - HM - 1-1 - 2025
## 03. අධ්‍යක්ෂ (මිරිදිය) තනතුර - HM - 1-1 - 2025

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ සත්ව විද්‍යාව හෝ ජලජීවී වගාව/ ධීවර කටයුතු පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධිය හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය/ කෘෂිකර්මය/ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ මූලික උපාධිය

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජලජීවී වගාව/ ධීවර කටයුතු ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම (විද්‍යාපති/ දර්ශනපති) සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලය/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක ''කළමනාකරණ මට්ටමේ'' තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) NAQDA හි ජල ජීවී වගාව/ මිරිදිය/ වෙරළබඩ/ ව්‍යාප්ති යන ක්ෂේත්‍රවල මධ්‍යම කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) කාලයක් සේවය කර තිබීම.

## 04. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) MM 1- 3 -2025

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(අ) කළමනාකරණය/ මානව සම්පත් පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සහ රජයේ දෙපාර්තමේන්තුවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර එකක (01) පරිපාලන අත්දැකීමක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) අධිකාරියේ කණිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

## 05. මත්ස්‍ය රෝග විශේෂඥ තනතුර - MM 1 - 3 -2025

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව පිළිබඳ සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ ධීවර/ ජලජීවී වගාව හෝ විද්‍යාවේදී ආහාර විද්‍යාව සහ පෝෂණය/ කෘෂිකර්මය/ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් එයට සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව පිළිබඳ සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ සත්ව විද්‍යාව හෝ ධීවර/ ජලජීවී වගාව සම්බන්ධ ක්ෂේත්‍රවල විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය/ කෘෂිකර්මය/ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් එයට සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

පළමු උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) අධිකාරියේ ජලජීවී වගාව/ මිරිදිය/ වෙරළබඩ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ (JM) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක පළපුරුද්ද.

## 06. සහකාර අධ්‍යක්ෂ (මිරිදිය) තනතුර - MM 1 - 3 Grade ii 2025
## 07. සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති) තනතුර - MM 1 - 3 Grade ii 2025

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව පිළිබඳ සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ සත්ව විද්‍යාව හෝ ධීවර/ ජලජීවී වගාව සම්බන්ධ ක්ෂේත්‍රවල විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය/ කෘෂිකර්මය/ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් සහ රජයේ දෙපාර්තමේන්තුවක / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජලජීවී වගාව / ධීවර කටයුතු පිළිබඳ වසර (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) අධිකාරියේ ජලජීවී වගාව/ ව්‍යාප්ති මිරිදිය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ (JM) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (5) ක පළපුරුද්ද.

## 08. ජලජීවී විද්‍යාඥ තනතුර - JM 1 - 1 Grade ii 2025
## 09. දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී තනතුර - JM 1 - 1 Grade ii 2025

**සුදුසුකම් සහ පළපුරුද්ද : බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජීව - විද්‍යාව පිළිබඳ සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ සත්ව විද්‍යාව හෝ ධීවර/ ජලජීවී වගාව සම්බන්ධ ක්ෂේත්‍රවල විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ආහාර විද්‍යාව සහ පෝෂණය/ කෘෂිකර්මය/ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට (NVQ 7) නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට (NVQ 6) නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

සහ

සුදුසුකම ලැබීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ 5) නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

සහ

සුදුසුකම ලැබීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

හෝ

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) ii ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 10. භාෂා පරිවර්තක තනතුර - MA - 4 Grade iii 2025

**සුදුසුකම් සහ පළපුරුද්ද**

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ට සාමාර්ථ ලබා තිබීම.

සහ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

සහ

(ඇ) ඉංග්‍රීසි - දෙමළ භාෂා පරිවර්තනය පිළිබඳ වසරක පළපුරුද්ද

## 11. ජලජීවී වගා සහකාර තනතුර - MA 2 - 1 Grade iii 2025
## 12. ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී තනතුර - MA 2 - 1 Grade iii 2025

**සුදුසුකම් සහ පළපුරුද්ද**

(අ) කෘෂිකර්මය/ ජලජීවී වගාව/ පශු සම්පත් පිළිබඳ ඩිප්ලෝමාව හෝ පිළිගත් තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TEC) විසින් පිළිගත් N.V.Q. මට්ටම 5 ට නොඅඩු වෙනත් සමාන සහතිකයක්.

## 13. කළමනාකරණ සහකාර තනතුර - තාක්ෂණික නොවන - MA 1 - 1 Grade iii 2025

**බාහිර අයදුම්කරුවන් : අධ්‍යාපන සුදුසුකම් :**

(අ) අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම,

සහ

(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විෂයයන් තුනකින් සමත් වීම (පොදු ප්‍රශ්න පත්‍රය හැර)

**අභ්‍යන්තර අයදුම්කරුවන් අධ්‍යාපන සුදුසුකම් :**

(අ) අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ ඇතුළුව විෂයයන් හයක් සමත් වී තිබීම,

සහ

(ආ) අධිකාරියේ ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු/ අර්ධ පුහුණු/ පුහුණු) තනතුරක අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවාවක් තිබීම.

## 14. විදුලි කාර්මික තනතුර - PL 3 - 2025 විදුලි / සිවිල්

**බාහිර අයදුම්කරුවන් අධ්‍යාපන සුදුසුකම් :**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (04) වන මට්ටමට (NVQ 4) නො අඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

(අ) බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

හෝ

(ආ) අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර ඇති, වෘත්තීය පරීක්ෂණයකින් සනාථ වූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (02) ට නොඅඩු කුසලතා සහිත ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (PL 2) හෝ නුපුහුණු (PL 1) සේවකයන්

## පොදු කොන්දේසි :

| අංක. | තනතුරු නාමය | වැටුප් කේතය | වැටුප් පරිමාණය | වයස් සීමාව |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ (ව්‍යාප්ති) | HM 1 - 1 2025 | 140,640 - 15 x 4100 – 202,140 | අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය |
| 02 | අධ්‍යක්ෂ (වෙරළබඩ) | HM 1 - 1 2025 | 140,640 - 15 x 4100 – 202,140 | |
| 03 | අධ්‍යක්ෂ (මිරිදිය) | HM 1 - 1 2025 | 140,640 - 15 x 4100 – 202,140 | |
| 04 | සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) | MM -1-3 2025 | 96,500 -10 x 2480 – 15 x 3450 – 173,200 | අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය |
| 05 | මත්ස්‍ය රෝග විශේෂඥ | MM -1-3 2025 | 96,500 -10x 2480 – 15 x 3450 – 173,200 | |
| 06 | සහකාර අධ්‍යක්ෂ (මිරිදිය) | MM 1 - 3 2025 | 96,500 -10 x 2480 – 15 x 3450 – 173,200 | |
| 07 | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති) | MM 1 - 3 2025 | 96,500 -10 x 2480 – 15 x 3450 – 173,200 | |
| 08 | ජලජීවී විද්‍යාඥ | JM 1 - 1 2025 | 72,650 -10 x1360 – 18 x 2040 -122,970 | |
| 09 | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | JM 1 - 1 2025 | 72,650 -10 x1360 – 18 x 2040 -122,970 | |
| 10 | භාෂා පරිවර්තක | MA 4 - 2025 | 64,320- 10x 1360 - 15 x 1670 - 5 x 2,040 –113,170 | |
| 11 | ජලජීවී වගා සහකාර | MA 2 - 1 2025 | 50,540- 10 x 540 -7 x 630 - 4 x 890 20 x 1,190 –87,710 | |
| 12 | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | MA 2 - 1 2025 | 50,540- 10 x 540 -7 x 630 – 4 x 890 20 x 1190 – 87,710 | අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය |
| 13 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1 - 1 2025 | 46,220 - 10x 540- 7 x 630 – 4x 890 20 x 1,190 – 83,390 | |
| 14 | විදුලි කාර්මික/ සිවිල් කාර්මික | PL 3 - 2025 | 43,280 – 10 x 490- 10 x 540 – 10 x 590 - 12 x 630 - 67,040 | |

★ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති 1/2025 චක්‍රලේඛයට අනුව වැටුප් සකස් කෙරේ.

**සටහන :** අභ්‍යන්තර අපේක්ෂකයන් සහ රජයේ/ පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

01 රජයේ/පළාත් පාලන දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයවලුන් තම අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය.

- ➢ අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- ➢ තනතුරේ රාජකාරි ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය.
- ➢ අයදුම්කරුවන් උසස් චරිතයකින් හෙබි විය යුතු ය.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන අනෙක් ප්‍රතිලාභ**

- ➢ වෛද්‍යාධාර රක්ෂණ ප්‍රතිලාභ
- ➢ තනතුරු සඳහා අනුමත වෘත්තීය දීමනා සහ අනෙකුත් දීමනා.

✶ www.naqda.gov.lk යන **NAQDA** වෙබ් පිටුවේ පළ කර ඇති උක්ත තනතුරු සඳහා අදාළ වන අයදුම්පත් ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් (ජීව දත්ත පත්‍රය සහ සියලුම සහතිකවල ඡායාපිටපත්), අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑල හරහා "**සභාපති, ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල**" වෙත **2025.10.31** දිනට ට පෙර එවිය යුතු ය.

✶ මෙම තනතුරු සඳහා NAQDA වෙබ් පිටුවේ සඳහන් කර ඇති මාර්ග ගත ක්‍රමය හරහා ද අයදුම් කළ හැකිය.

✶ මෙම තනතුරු වලට අදාළ අනෙකුත් තොරතුරු NAQDA වෙබ් පිටුවෙහි සඳහන් කර ඇත.

✶ මෙම තනතුරු සඳහා මාර්ගගත ක්‍රමය හෝ ලියාපදිංචි තැපෑල යන දෙකෙන් එකක් පමණක් භාවිතා කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය**

SELACINE